ජනමාධ්‍ය අමාත්‍යාංශය
வெகுசன ஊடக அமைச்சு
MINISTRY OF MASS MEDIA




සැලසිනෙ
செலசினே
SELACINE
**SELACINE TELEVISION INSTITUTE**




# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# ANNUAL REPORT
# 2017

ගරු ජනමාධ්‍ය අමාත්‍යතුමා
ජනමාධ්‍ය අමාත්‍යාංශය
කොළඹ 05.

ගරු අමාත්‍යතුමනි,

**වාර්ෂික වාර්තාව - 2017**

1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය වෙනුවෙන් සැලසිනෙ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

2017/05/22

ප්‍රභාත් සී. පෙරේරා
සභාපති
සැලසිනෙ රූපවාහිනී ආයතනය
කොළඹ 07

# පෙළ ගැස්ම


දැක්ම, මෙහෙවර, අරමුණු
05

සභාපතිතුමාගේ සමාලෝචනය
07

ආයතනික තොරතුරු
08

පරිපාලන ව්‍යුහය 2017 හා සම්බන්ධ තොරතුරු
09

මූල්‍ය වාර්තා - 2017
19

මූල්‍ය වාර්තා සඳහා සටහන්
22

ආදායම් ප්‍රකාශය
25

ශේෂ පත්‍රය
26

මුදල් ප්‍රවාහ ප්‍රකාශය
27

මූල්‍ය වාර්තා සඳහා සටහන්
29

2017 වර්ෂයේ මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ විගණකාධිපතිතුමාගේ මතය
39

2017 වර්ෂයේ විගණකාධිපතිතුමාගේ වාර්තාව සඳහා පිළිතුරු
46

## දැක්ම

රාජ්‍ය යාන්ත්‍රණයේ සංවර්ධන හා මෙහෙයුම් සහ සියලු ව්‍යාපාර ක්ෂේත්‍රයන්හි ප්‍රවර්ධනයන් නිර්මාණාත්මකව සන්නිවේදනය කිරීම තුළින් ප්‍රචාරණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වීම

## මෙහෙවර

නිපුණත්වයෙන් හෙබි වඩාත් නිර්මාණශීලී හා දිරිමත් පුද්ගල සහය භාවිතා කරමින් උපක්‍රමශීලිත්ව මෙන්ම උසස් තලයේ තාක්ෂණය ද නිර්මාණාත්මකව උපයෝගී කරගනිමින් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සඳහා සන්නිවේදන සහ වෙනත් නිර්මාණශීලී ප්‍රචාරාත්මක අනගි සේවාවක් සැපයීම තුළින්

ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය සහ දේශපාලන සංවර්ධනය සඳහා සක්‍රීයව දායක වීම.

## අරමුණ

මූල්‍ය තත්ත්වය ඉහළ දැමීම.

වෙළෙඳපොල ලාභය ඉහළ දැමීම.

සේවාලාභී සංස්කෘතිය ඉහළ දැමීම සඳහා වූ උපක්‍රම ක්‍රියාත්මක කිරීම.

ආයතන සේවකයින් සහ නායකයින් වර්ධනය කිරීම.



# සභාපතිතුමාගේ සමාලෝචනය

මා සැලසිනේ රූපවාහිනී ආයතනයේ සභාපතිධුරයට පත්වීමෙන් අනතුරුව ආයතනය විසින් එළිදක්වන ලබන 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාවට පණිවුඩයක් නිකුත් කිරීමට අවස්ථාවක් ලැබීම සම්බන්ධයෙන් සතුටු වෙමි.

පසුගිය වසර තිස්පහක කාලසීමාව දෙසට ආපසු හැරී බැලීමේ දී සැලසිනේ ආයතනය අලෙවි, මූල්‍ය, පරිපාලන, නිෂ්පාදන, ඉසව්, නිර්මාණ යන අංශයන්ගෙන් සැලකිය යුතු පරිදි දක්ෂතා ඔපමට්ටම් කර ගැනීමට හැකි වී ඇත.

2016 වර්ෂයේ දී රු. මි.397.6 ක වාර්ෂික ආදායමක් ලබාගත් අතර, එය 2017 වර්ෂයේ දී රු. මි. 637.3 ක් දක්වා වර්ධනය කර ගැනීමට හැකිවිය. 2016 වර්ෂයට වඩා 2017 වසරේ අලෙවි වර්ධනය රු. මි. 239.7 කි. වසර ගණනාවකට පසු රු. මිලි. 1.2 ක ලාභයක් ඉපයීමට මෙම වර්ෂයේ හැකි විය. ඉතිහාසයේ වැඩිම අලෙවි වර්ධනයක් ලත් වසරක් ලෙස සනිටුහන් වී ඇත.

ආයතනයේ අලෙවි කටයුතු නංවාලීමට සෑහෙන කාර්යභාරයක් ඉටුකිරීමට අපේක්ෂා කරන අතර, ඒ සඳහා කාර්ය මණ්ඩලය පෙළගස්වමින් කටයුතු සිදු කරනු ලැබේ.නවීන තාක්ෂණය උපයෝගී කරගනිමින් සන්නිවේදන කටයුතු වලට කාර්ය මණ්ඩලය හුරුකරමින් කාර්යක්ෂමතාව නංවාලීමට කඩිනම් පියවර ඉදිරියේ දී ගනු ලැබේ.

මූල්‍ය අංශයේ කටයුතු වඩාත් ඉක්මනින් ඉටුකර ගැනීමට සුදුසු ගිණුම් පද්ධතියක් හඳුන්වා දීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී, සූදානම් කරමින් පවතී. ඒ තුළින් වඩාත් නිවැරදි වූත් තොරතුරු කඩිනමින් ලබා දීමට හැකියාව මූල්‍ය අංශයට ලබාදෙනු ලැබේ. පරිපාලන අංශයේ නිලධාරීන් සඳහා පුහුණු අවස්ථා ලබාදීම මගින් නව නීති රීති, පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීමට හා ඔවුන්ගේ කුසලතා වර්ධනය, මානව සම්පත් සංවර්ධනය සඳහා අවශ්‍ය අභිප්‍රේරණයන් ආයතනය තුළින් ලබාදීමට සැලසුම් කරනු ලැබේ. රක්ෂණාවරණයක් ලබා දීම, ක්‍රීඩා තරඟ පවැත්වීම තුළින් සේවක සුභදතාවය වර්ධනය කිරීමට පියවර ගෙන ඇත.

නිශ්පාදන අංශය විසින් පෙර වර්ෂයට වඩා වැඩි කාර්යභාරයක් ඉටු කිරීමට මෙම වසරේ සමත්වී ඇත. ජාතික ලොතරැයි මණ්ඩලය සමග එක්ව කටයුතු කිරීම තුලින් එම අගය වැඩි ඵලදායීතාවයක් පෙන්වීමට සමත් විය. මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා අවශ්‍ය දැන්වීම් සැකසීම ඉතා උසස් මට්ටමක තිබීම සතුටට කරුණකි. අභ්‍යන්තර විගණන අංශයේ කාර්යක්ෂතාව නංවාලීම තුලින් වැරදි අඩුපාඩු නිවැරදි කිරීමට අපේක්ෂා කරන අතර ඒ සඳහා අවශ්‍ය උපකරණ කාර්ය මණ්ඩලයට ලබා දීමට ක්‍රියාකර ඇත.


නිර්මාණ අංශය විසින් එම කටයුතු ඵලදායීතාවයෙන් යුතුව සිදු කරන ලද අතර, පෙරට වඩා වැඩි දායක්වයක් ඔවුන් විසින් ලබා දී ඇත. V2025 වැනි නිර්මාණ ඒ අතර, කැපී පෙනෙන තත්වයක් ඇති කරයි.

ඉසව් කළනාකරණ අංශය වසරේ වැඩිම ඉසව් ගණනාවක් කිරීමට සමත්විය. ඒ අතරින් තොරතුරු දැනගැනීමේ පනත, එක්සත් ජාතීන්ගේ වෙසක් දිනය, ජනාධිපති සිනමා සම්මාන උළෙල ඉතා වටිනාකමක් එකතු කල ඉසව් අතරින් කිහිපයකි.

මාධ්‍ය අංශය විසින් ලේක්හවුස් ආයතනය සමඟ එක්ව ඉතා වැඩි වටිනාකමක් ඇති දැන්වීම් ප්‍රචාරණය කිරීමට දායක විය. මේ නිසා ලේකහවුස් ආයතනයේ පලමු ස්ථානයට පෙර පරිදිම රැක ගෙන යාමට හැකිවීම සතුටට කරුණකි.

තරඟකාරී ආර්ථික පරිසරයට හුරුවන ලෙස අළුත් ඉසව් කටයුතු සඳහා අනුගත කිරීම, අනාගත අලෙවි ඉලක්ක වර්ධනය ඉදිරි කාල සීමාවේ දී ඉටුකර ගැනීමට අපේක්ෂිතය.

රජයේ එකම ප්‍රචාරණ ආයතනය ලෙස සැලසිනෙ ආයතනයට පැවරෙන වගකීම් නිසි ලෙස ඉටුකර ගැනීමට සියළු දෙනාම එක්වීම තුළින් අරමුණ ජයග්‍රහණය කිරීම මෙම යුගයේ පැවරෙන කාර්යභාර්ය වනු ඇත.



ප්‍රභාත් සී. පෙරේරා
සභාපති
සැලසිනෙ රූපවාහිනී ආයතනය

# ආයතනික තොරතුරු

## නාමය

සැලසිනෙ රූපවාහිනී ආයතනය

## නීතිමය ස්වරූපය හා අතීත කාර්ය ස්වභාවය

- 1982 පෙබරවාරි 01 දින සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ අධිකාරිත්වය යටතේ ආරම්භ විය.
- 1982 සිට 1989 දක්වා ඉඩම්, වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය යටතේ වූ රාජ්‍ය දැව සංස්ථාවේ මානව හා මූල්‍ය සම්පත් යටතේ මහවැලි කඩිනම් සංවර්ධන වැඩසටහන පිළිබඳ ශ්‍රී ලාංකීය ජනතාව දැනුවත් කිරීමේ කාර්යය සිදුකිරීම.
- 1989 ජනසවිය වැඩසටහනේ ප්‍රචාරාත්මක කාර්යභාරය සිදුකිරීම
- 1989.08.19 දිනැති අංක 832/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් සැලසිනෙ ආයතනය යෞවන කටයුතු, ක්‍රීඩා හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය යටතට පවරන ලදී. (මෙය ආයතනය සම්බන්ධව ගැසට් නිවිදනයක් මගින් කරනු ලැබූ පළමු පැවරීමයි)
- 1997.06.09 දිනැති අංක 979/2 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් තැපැල්, විදුලි සංදේශ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පවරන ලදී.
- 2001.12.20 දිනැති 1215/14 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ජනසන්නිවේදන අමාත්‍යාංශය වෙත පවරන ලදී.
- 2004.04.28 දිනැති 1338/9 දරන අති විශේෂ ගැසට් නිවේදනය තුළින් තොරතුරු හා මාධ්‍ය අමාත්‍යාංශයට අයත් ආයතනයක් ලෙස නම් කරනු ලැබීය.
- 2005/12/08 දිනැති 1422/22 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයට අයත් ආයතනයක් ලෙස ස්ථාපිත කරනු ලැබීය.
- 2007 අංක 07 දරන සමාගම් පනතෙහි විධිවිධානයන්ට අනුව පූර්ණ අයිතිය රජයට හිමි පොදු සමාගමක් බවට පත්කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත 2008. 03. 26 දිනැති සන්දේශය ඉදිරිපත් කෙරුණි.

## ආයතනික කාර්ය භාරය

- රජයේ මාධ්‍ය ප්‍රචාරණ හා නිෂ්පාදන ආයතනය ලෙස ක්‍රියාත්මක වීම.
- 2005. 05. 16 දින අංක 1380/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් පහත සඳහන් කරුණු කාර්ය විෂය පථයට ඇතුළත් කෙරුණි.
  - i. මුද්‍රිත / විද්‍යුත් මාධ්‍ය දැන්වීම් නිෂ්පාදනය
  - ii. රජයේ සංවර්ධන ක්‍රියාදාමයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ ප්‍රචාරක කටයුතු
  - iii. රජයේ ප්‍රචාරක වැඩසටහන් නිෂ්පාදනය
- 2008.12.02 දිනැති ජනමාධ්‍ය හා තොරතුරු ගරු අමාත්‍යතුමාගේ සංදේශය සම්බන්ධ නිරීක්ෂණයෙන් අනතුරුව 2008.12.24 දිනැති අංක 08/2253/338/043 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් සියලුම අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති ආයතනවල සියලුම වෙළෙඳ දැන්වීම් හා ප්‍රචාරාත්මක වැඩසටහන් සැලසිනෙ රූපවාහිනී ආයතනය මගින් ඉටුකරවා ගැනීම අනිවාර්ය කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.
- රූපවාහිනී වාර්තාමය වැඩසටහන්, ගුවන් විදුලි වැඩසටහන් මෙන්ම රූපවාහිනී හා ගුවන් විදුලි වෙළෙඳ දැන්වීම් යනාදී ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණයන් නිෂ්පාදනය කිරීම
- විවිධ වූ පුවත්පත් දැන්වීම් නිර්මාණය මෙන්ම එම දැන්වීම් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන්හි උපලේඛනගත කිරීම.
- ඉසව් කළමනාකරණය හා මුද්‍රණ කටයුතු.

# පරිපාලන ව්‍යුහය - 2017

## ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය

| | | |
|---|---|---|
| තුසිත ජයවර්ධන | - | සභාපති (2017.01.01 - 2017.06.20) |
| ජේ.එම්.එන්.එස්. ජයවර්ධන | - | සභාපති (2017.06.21 - 2017.12.31) |
| සනත් ධර්මරත්න | - | සාමාන්‍යාධිකාරී |

## කළමනාකරණය

| | | |
|---|---|---|
| ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න | - | කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන) (2017.01.01 - 2017.10.31) |
| ඊ.එම්.ඒ.ආර්. ඒකනායක | - | කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන) (2017.11.01 - 2017.12.31) |
| අතුල අන්ද්‍රාදි | - | කළමනාකරු (නිෂ්පාදන) |
| අග්බෝ අමරසේකර | - | පාරිභෝගික සේවා අධ්‍යක්ෂ |
| නලීන් අලහකෝන් | - | කළමනාකරු (මාධ්‍ය) |
| ශාන්ත ලොකුකැටගොඩ | - | කළමනාකරු (මූල්‍ය) |
| සුජිත් පුෂ්පකුමාර | - | කළමනාකරු (ග්‍රැෆික්) |

## විගණක

රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව

## බැංකුකරුවන්

ලංකා බැංකුව

මහජන බැංකුව

## සම්බන්ධීකරණ තොරතුරු

| | | |
|---|---|---|
| **ලිපිනය** | - | අංක. 224, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 |
| **දුරකථනය** | - | 011-4320777, 011-4061586 |
| **ෆැක්ස්** | - | 011-2058229 |
| **විද්‍යුත් තැපෑල** | - | selacine@gmail.com |
| **වෙබ් අඩවිය** | - | www.selacine.lk |




# නිර්මාණ සහ ග්‍රැෆික් අංශය

සැලසිනෙ ආයතනයේ කාර්යශූර හා නිර්මාණශීලී තවත් අංශයක් ලෙස නිර්මාණ හා ග්‍රැෆික් අංශය හඳුන්වාදිය හැකිය. මෙම අංශයෙහි පළපුරුදු වෘත්තීය ග්‍රැෆික් නිර්මාණ ශිල්පීන් ඕනෑම නිර්මාණශීලී කටයුත්තක් සඳහා නිරතුරු සූදානමින් සිටියි. ඔවුන් පැය අටක කාල රාමුවක් තුළට කොටු නොවී ග්‍රැෆික් නිර්මාණකරණයේ නව තාක්ෂණික දැනුමෙන් නිරන්තර යාවත්කාලීන වෙමින් තමන් හට පැවරුණු කාර්යයන් නිසි වගකීමෙන් යුතුව කැපවී ඉටු කරයි.

පුවත්පත් දැන්වීම් නිර්මාණකරණය, ත්‍රිමාණකරණය, ත්‍රිමාණ සජීවීකරණය මෙන්ම පෝස්ටර් සහ බැනර් ආදී ප්‍රකාශනයන් නිර්මාණය කිරීමෙහිලා මූලික කේන්ද්‍රස්ථානය වනුයේද මෙම අංශයයි. වේලාව අවේලාව තැකීමකින් තොරව තම කාර්යභාරය ඉටු කරනු ලබන අප අංශය, නිර්මාණශීලීත්වය හා කලට වේලාවට වැඩ නිම කර දීම මෙන්ම අප සේවාදායකයන් සමඟ වෘත්තීය වශයෙන් පවත්වාගෙන යනු ලබන සුහදශීලී මහජන සම්බන්දතාවයන් හේතුවෙන් එම සේවාදායකයන්ට අපගේ දීර්ඝකාලීන සේවාවන් සැපයීමත් අප හට පාරිභෝගිකයින්ගෙන් හිමි වන නොමද ප්‍රශංසා ආදියට හේතු වෙයි.

ලේක් හවුස් ආයතනය වෙත ලැබෙන දෛනික පුවත්පත් දැන්වීම් අතුරින් වැඩිම පුවත්පත් දැන්වීම් ප්‍රමාණයක් ලබාදෙනුයේ අපගේ සැලසිනෙ ආයතනයයි. එම දැන්වීම් නිර්මාණය කිරීමේ භාරදූර වගකීම සෘජුවම නිර්මාණ හා ග්‍රැෆික් අංශය වෙත පැවරෙයි. එම වගකීම නොපිරිහෙලා ඉටුකරමින් උසස් තාක්ෂණික දැනුම භාවිතයෙන් ගුණාත්මකව මෙන්ම නිරවද්‍යතාවයෙන් යුතුව නිර්මාණය වන දැන්වීම් ගොන්න ආයතනයේ කීර්ති නාමය වෙතටද ගෙන එන්නේ ආලෝකයකි.

වසර ගණනාවක් පුරා මෙලෙස සිදුවන ක්‍රියාවලිය තුළ අන් වසර වල මෙන්ම 2017 වසරේදී ද ගුණාත්මකබව සහ කාර්යක්ෂමතාව දිනෙන් දින වැඩි කරගනිමින් සැලසිනේ නිර්මාණ හා ග්‍රැෆික් අංශය ඉදිරියටම පියනගමින් සිටියි.

# මාධ්‍ය අංශය

මාධ්‍ය අංශයේ ප්‍රමුඛ කාර්යභාරය වන විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යන්හි දැන්වීම් සහ ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණ උපලේඛන ගත කිරීමිය. එය සෑම වර්ෂයකම වැඩිම ආදායම් උපදවන්නේ මාධ්‍ය අංශයේ උපලේඛන ගත කිරීම් තුළිනි. ඒ අනුව 2017 වර්ෂයේද වඩාත් කාර්යක්ෂමව සිදු කරන ලදී. මෙහිදී සමස්ත ආයෝජනය රු. මිලියන 405 කි.

2017 වර්ෂයේද ලේක්හවුස් පුවත්පත් ආයතනය වෙත වැඩිම දැන්වීම් ප්‍රමාණයක් ලබා දෙන ලදී.

2017 වර්ෂය තුළදී අපගේ ප්‍රමුඛපෙලේ සේවා දායකයෙක් වන ලංකා විදුලි බල මණ්ඩලය වෙතින් පමණක් කරන ලද දැන්වීම් ආයෝජනය රු. මිලියන 154 කී. මෙවැනි උපලේඛනගත කිරීම් තුළින් අප බලාපොරොත්තු වූ ඉලක්කයන් කරා නිවැරදිව යාමට හැකි විය.

ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රමුඛපෙලේ දැන්වීම් ප්‍රචාරණ නියෝජිත ආයතනයක් ලෙස අපගේ නිර්මාණ කාර්යයන් පමණක් නොව ප්‍රචාරණ කාර්යයේ ද ඉහළ මට්ටමේ හැකියාවන් සැලසිනෙ සතු බව මෙයින් පෙන්නුම් කෙරේ.





# අලෙවි හා පාරිභෝගික සේවා අංශය

2017 වර්ෂය තුළ අලෙවි අංශය පසුගිය වර්ෂය හා සැසඳීමේ දී සැලකිය යුතු වාර්තාගත අලෙවි වර්ධන ප්‍රගතයක් අත්පත් කරගැනීමට හැකිවීම විශේෂත්වයකි.මෙම වසරෙහි, මූලික අලෙවි ආදායම වන රු. 638,957,078.32 ක් වාර්තා වී තිබූ අතර, පුවත්පත්, රූපවාහිනී දැන්වීම් නිශ්පාදනයෙහි ආදායම කැපී පෙනෙන ආදායම් වාර්තා වී ඇත.

මෙම ඉලක්ක ගත ආදායම උපයා ගැනීම සඳහා අප අංශයෙහි අලෙවි විධායකයන්ගේ සුවිශේෂ කැපවීම සහ අනෙකුත් අංශයන්හි දැක් වූ සහයෝගය මේ අවස්ථාවේ කෘතඥ පූර්වකව මතක් කර සිටිමු.



# මානව සම්පත් හා පරිපාලන අංශය

අපගේ ඉහලම වත්කම අප සතු මානව සම්පත වන්නේය.අප ආයතනයේ ඉදිරි ගමන් මගේ ඉලක්කයන් සපුරා ගැනීමට යන ගමනේ මානව සම්පත තුළින් උපරිම දායකත්වය ලබා ගැනීමේ පරමාර්ථයෙන් අප අංශය වෙතින් 2017 වර්ෂය සඳහා සිදු කරන ලද මෙහෙවර මෙසේය.

- වසර 33 ක ඉතිහාසයකට උරුමකම් කියන අප ආයතනය නීතිගත කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම මෙම වර්ෂයේ සිදුකරන ලද ප්‍රධානම කර්තව්‍යයකි. ඊට සමගාමීව ආයතනික ව්‍යුහය සකස් කිරීම, බඳවා ගැනීමේ පටිපාටිය විධිමත්ව සකස් කිරීමද මෙහි විශේෂත්වයක් ගනී.
- පෙර වර්ෂයනහිදී මෙන්ම 2017 වර්ෂයේ දී කාර්ය මණ්ඩලයේ පුහුණුව හා සංවර්ධනය වැඩිදියුණු කිරීමේ අරමුණින් විවිධ අධ්‍යාපන ආයතන තුළින්, දියත් කර ලද පුහුණු වැඩමුළු සඳහා සේවකයින් යොමු කිරීම හා ඊට අදාළ මූල්‍ය අනුග්‍රාහකත්වය ලබාදීම සිදු කරන ලදි. එසේම කාර්ය මණ්ඩලයේ වෘත්තීය අධ්‍යාපනය සංවර්ධනය කිරීමෙහිලා අධ්‍යාපන පාඨමාලාවන් වෙනුවෙන් ආයතනික මූල්‍ය අනුග්‍රාහකත්වය ලබා දී ඇත.
- ආයතනයේ කාර්ය මණ්ඩලයේ සුබසාධක වෙනුවෙන් ඉහල ප්‍රතිලාභ වලින් යුත් සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් ලබාදීම, සේවක ණය ලබාදීම, උත්සව අත්තිකාරම්, ප්‍රසාද දීමනා ලබා දීම තුළින් සේවකයන් විසින් ආයතනය වෙත ලබාදී ඇති දායකත්වය වෙනුවෙන් දිරිගැන්වීම.
- කාර්ය මණ්ඩලයේ සුහදතාවය වර්ධනය කිරීමේ අරමුණින් කාර්ය මණ්ඩලයේ හා ඔවුන්ගේ පවුලේ හිතවතුන් වෙනුවෙන් සුහද හමුවක් පැවැත්වීම.
- කාර්යක්ෂම සේවාවක් ලබා ගැනීම සඳහා කාර්ය මණ්ඩලයේ ඉල්ලීම පරිදි ඔවුන්ට අවශ්‍ය කාර්යාලීය උපකරණ කඩිනමින් ලබා දීමට කටයුතු කිරීම.



# නිෂ්පාදන අංශය

2017 වසරේදීද සැලසිනෙ නිෂ්පාදන අංශය නිර්මාණාත්මක මුහුණුවරකින් යුත් හරවත් රසවත් නිර්මාණ රැසක් නිපදවන ලදී. නිෂ්පාදන ශිල්පීන්ගේ කුසලතා කැපවීම් මෙන්ම එකමුතුකම සහෝදරත්වය තුළින් මෙම නිර්මාණ තව තවත් හැඩ වැඩ වන්නට විය.

ඩෙංගු මර්දන ඒකකය වෙනුවෙන් නිපදවන ලද රූපවාහිනී වෙළඳ දැන්වීම් හතර සහ කෙටි නාට්‍ය හතර, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වෙනුවෙන් නිපදවන ලද රූපවාහිනී දැන්වීම් කිහිපය, පොලිතින් භාවිතය අවම කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙනුවෙන් “අතේ වැරදි හතරයි” තේමාව යටතේ නිපදවන වෙළඳ දැන්වීම, ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව වෙනුවෙන් නිපදවන ලද වාර්තා වැඩසටහන ආදිය 2017 වසරේ සැලසිනෙ නිර්මාණ අස්වැන්නේ සාරවත් ඵලයන්ය.

වසරින් වසර නිර්මාණකරණයෙහි, දිගු පියවර තබමින් සැලසිනෙ නිෂ්පාදන අංශය යන ගමනේදී සහෘද චිත්ත සන්තානය සනසනු වස් රූප පෙට්ටියෙන් දිග හැරුණු අදටත් මතකයේ රැඳි නිර්මාණද එමටය. ඉදිරියටත් එවන් වූ ගුණාත්මක රසවත් නිර්මාණ රැසක් ඔස්සේ හරවත් ඵලදායී මාධ්‍ය මෙහෙවරක යෙදීමට සැලසිනෙ අප සූදානම්.



# මූල්‍ය අංශය

සැලසිනෙ ආයතනයේ ගිණුම් කටයුතු වඩාත් කාර්යක්ෂම ලෙස කරගෙන යාමට අවශ්‍ය පියවර ගන්නා ලදි. සියළුම ගෙවීම් කටයුතු සඳහා අවශ්‍ය බැරකම් පිළිබඳව නොපමාව පරිගණක ගත කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. ඒ අනුව බැරකම් හඳුනාගෙන ගිණුම් වාර්තා ඉක්මනින් පිළියෙළ කිරීමට හැකි වී ඇත.

මූල්‍ය වාර්තා සැකසීම කඩිනමින් සිදු කරන ලදි. 2011, 2012, 2015, 2016 යන වර්ෂවලදී මෙන්ම නැවත වරක් 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය රාජ්‍ය ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූලව **සත්‍ය හා සාධාරණ තත්වයක් පෙන්නුම් කරන බව විගණකාධිපති මතයක් පල කිරීම සැලකිය යුතු ජයග්‍රහණයන් බව සඳහන් කල යුතුය**.

විගණකාධිපතිගේ මතය මෙයට වඩා ඉහල මට්ටමකට ගැනීමට මූල්‍ය අංශයේ සියළුම නිලධාරීන් කැප වී කටයුතු කරනු ලැබේ.




# ඉසව් කළමනාකරණ අංශය

2015 වර්ෂයේ නව අංශයක් ලෙස ආරම්භ කරන ලද ඉසව් කළමනාකරණ අංශය ආදායම් ඉපයීම උදෙසා ඉතා ශීඝ්‍ර දායකත්වයක් ලබා දෙන අංශයක් බවට මේ වන විට පත්ව තිබේ. නව්‍යවාදී මුහුණුවරකින් තරඟාකාරී ආයතන සමග කරට කර තරඟ කරමින් වෙනස් වූ ක්‍රමවේද භාවිතා කරමින් ආයතනයට ආදායම් ඉපයීමේ ක්‍රම වේදයට සෘජුදායකත්වයක් මෙම අංශයෙන් සිදු කරනු ලබයි.

2016 වර්ෂයේ මිලියන 48 ක ඉසව් ආදායමක් ලබාගත් මෙම අංශය 2017 වර්ෂයේ දී මිලියන 150 ක ආදායමක් ලබමින් සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරයි. ඒ සඳහා පහත සඳහන් ප්‍රමුඛතම ඉසව් කළමනාකරණ දායකත්වයක් ලබා දී තිබේ.


- මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යංශය විසින් සිදු කරනු ලැබූ ජනාධිපති සිනමා සම්මාන උළෙල
- ක්‍රීඩා අමාත්‍යංශය විසින් සංවිධානය කරනු ලැබූ ජාතික ක්‍රීඩා උළෙල
- එකසත් ජාතීන්ගේ වෙසක් සැමරුම (බුද්ධශාසන අමාත්‍යංශය)
- මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යංශය විසින් සංවිධානය කරනු ලැබූ අහන්න ගීතය (සංහිඳියාව සම්බන්ධව)
- මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යංශය විසින් සංවිධානය කරනු ලැබූ 77 පෙරළිය
- සෞඛ්‍ය අමාත්‍යංශය විසින් සංවිධානය කරන ලද නෙවිල් ප්‍රනාන්දු රෝහල රජයට පවරා ගැනීම

උක්තව සඳහන් වැඩසටහන් සඳහා ඉසව් කළමනාකරණ කටයුතු අප ආයතනයේ ඉසව් අංශයෙන් සිදු ව අතර, එම ඉසව් ඉතාම විචිත්‍රවත්ව හා සාර්ථක අයුරින් නිම කිරීමට අප ආයතනයට හැකියාව ලැබුණි. මෙම අත්දැකීම් හා ආදායම් විශ්ලේශනය කරමින් 2018 වර්ෂයේ ආදායම තවදුරටත් වර්ධනය කර ගැනීම මෙම අංශයේ අරමුණයි.


# මූල්‍ය වාර්තාව 2017



### ආදායම් වර්ධනය





### පසුගිය වසර පහ තුළ දල ලාභයේ ප්‍රවණතාවය



# 2013 - 2017 වසර අතර ආයතනික ලාභයේ උපනතිය

**පසුගිය වසර පහ තුළ ආදායම් සහ සෘජු වියදම් වල උපනතිය**



# මූල්‍ය වාර්තා සඳහා සටහන්

## 2017 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ගිණුම් ප්‍රතිපත්ති

### 1. පොදු කරුණු

1.1 සංයුක්ත තොරතුරු

සැලසිනෙ රූපවාහිනී ආයතනය (මින් පසු සැලසිනෙ නාමයෙන් හැඳින්වෙන) 2017.06.09 වෙනි දිනැති අංක 2022/34 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි විෂය පථයට ඇතුළත් කෙරිණි.

1.2 මූලික කාර්යයන් සහ මෙහෙයුම් ස්වභාවය

ප්‍රචාරණය, රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන් මෙන්ම ඉසව් කළමනාකරණය සැලසිනෙහි මූලික කාර්යයන් අතර ප්‍රධාන තැනක් ගනියි.

1.3 සේවක ප්‍රමාණය

2017.12.31 වෙනි දින වනවිට 69 ක සේවක ප්‍රමාණයක් සිට ඇත.

### 2. ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳව සුවිශේෂී කරුණුවල සංක්ෂිප්තය

2.1 පොදු ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශනයක් සකස් කර ඇත්තේ පොදුවේ පිළිගත් ගිණුම් ප්‍රතිපත්ති සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ මඟ පෙන්වීම යටතේ පවත්නා ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූලව ය. ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශ සකස්කර ඇති අතර දිගින් දිගටම පවත්වා ගැනීමේ පදනම මත ඉදිරිපත් කර ඇත.

2.2 ස්ථායීතාවය සහ සැසැඳුම්

මෙම වසර සඳහා යොදා ගන්නා ලද ගිණුම් ප්‍රතිපත්ති පසුගිය වසරේ දී යොදා ගත් ප්‍රතිපත්ති සමඟ අනුකූල වේ.

2.3 ණය පිරිවැය

මෙහි ණය පිරිවැය හඳුනාගෙන ඇත්තේ අදාළ ගිණුම් කාලය තුළ දරන ලද වියදම් ලෙස ය.

### 3. වත්කම් තක්සේරුව සහ එහි ඇගයුම් පදනම

3.1 දේපල, පිරියත සහ උපකරණ

පිරිවැය හෝ ප්‍රත්‍යාගණනය මත දේපල, පිරියත සහ උපකරණ පිළිබඳ වාර්තා සකස් කර ඇත.

3.2 වෙළෙඳ හා ලැබිය යුතු වෙනත් දෑ

වෙළෙඳ හා ලැබිය යුතු වෙනත් දෑ ඇස්තමේන්තු කළ උපලබ්ධි අගය මත සඳහන් කර ඇත.

3.3 මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ සඳහා අතැති මුදල් සහ බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු කෙටිකාලීන ඉහළ ද්‍රව ශීලතාවය ඇති ආයෝජන මෙයට ඇතුළත් වේ.

3.4 ක්ෂය කිරීම්

ආදායම් ප්‍රකාශය තුළ ක්ෂය වීම් ලෙස හඳුන්වනු ලැබුණේ ප්‍රයෝජනයට ගත හැකි යැයි ඇස්තමේන්තු ගතකර තිබෙන වත්කම් පදනම් කරගත් සරල මාර්ග ක්‍රමය යොදා ගනිමිනි. මූල්‍ය කල්බදු යටතේ පවතින කෙටිකාලීන හා ප්‍රයෝජනයට ගත හැකි සමාන වටිනාකම් සහිත වත්කම් මත ක්ෂය කිරීම් සිදුකර ඇත.

දේපල, පිරියත හා උපකරණ අයිතමයන්ගේ ක්ෂය අනුපාතයන් පහත දැක්වේ.

| | |
|---|---|
| ලී බඩු හා සවිකිරීම් | වර්ෂ 2 - 10 |
| පරිගණක උපාංග | වර්ෂ 3 - 5 |
| කාර්යයාලීය උපකරණ | වර්ෂ 10 |
| මෝටර් වාහන | වර්ෂ 05 |
| කැමරා උපකරණ | වර්ෂ 10 |
| ගිණුම්කරණ මෘදුකාංග | වර්ෂ 10 |

**4. වගකීම් හා ප්‍රතිපාදන**

4.1 ශේෂ පත්‍ර දින සිට වසරක කාලයක් තුළ ඉල්ලුම මත ගෙවීමට ඇති ජංගම වගකීම් ශේෂ පත්‍රයෙහි වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත. ශේෂ පත්‍ර දින සිට වසරක කාලයකට පසුව ගෙවීමට නියමිත වගකීම් දීර්ඝ කාලීන වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත.

4.2 විශ්‍රාම හා පාරිතෝෂික දීමනා

සේවක ප්‍රතිලාභ - SLAS 16 (සංශෝධිත 2006) විධිවිධානයන් යටතේ සියලු සේවකයන්ගේ විශ්‍රාමික ප්‍රතිලාභ සේවයේ පළමු වසරේ සිටම ප්‍රතිපාදනය කර ඇත.

1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා පනතට අනුකූලව වී යටතේ වසර 5 ක් එක දිගට පවත්වාගෙන ගොස් සේවය අවසන් කරන්නා වූ සේවකයින් සඳහා වන වගකීමක් ලෙස ප්‍රතිපාදන වෙන් කර ඇත.

4.3 අර්ථ දැක්වූ දායකත්ව සැලසුම් - සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

සේවය අවසන් කළ සේවකයන් සඳහා ප්‍රතිලාභ සැලසුමක් ලෙස යම්කිසි අයතනයක් මගින් තවත් ආයතනයකට ගෙවන්නා වූ ස්ථිර දායකත්වයක් හැර තවදුරටත් වෙනත් ගෙවීමක් කිරීමට නෛතික හෝ අර්ථකාරී බැඳීමක් නොමැති සේවක ප්‍රතිලාභ සැලසුමක් අර්ථ දැක්වූ දායකත්ව සැලසුමක් වේ. සියලුම සේවකයින් ආවරණය කරන පරිදි අර්ථසාධක හා භාරකාර අරමුදල් සඳහා දායකත්වය සැලසීමට ඇති බැඳීමකින් කරන ගෙවීම් ලාභාලාභ ගිණුම සඳහා වියදමක් ලෙස එය කරන්නා වූ අවස්ථාවේදී ම හඳුන්වනු ලැබේ. සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලව සේවායෝජකයාගේ දායකත්වය ලැබීමට සේවකයින් සුදුසුකම් ලබයි.

සේවක දල වැටුපෙන් 15%ක් හා 3%ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදල් වෙත සැලසිනෙ දායකත්වය ලබාදෙයි.

**5. ආදායම් ප්‍රකාශය**

5.1 පිරිවැටුම

සැලසිනෙහි පිරිවැටුම ග්‍රැෆික් චිත්‍ර නිර්මාණ, උපලේඛනගත කිරීම්, ඉසව් කළමනාකරණය සහ රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන් නිෂ්පාදනය තුළින් ලැබේ.

5.2 ආදායම් හඳුනා ගැනීම

ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුළට ගලා එන බවට සහ ඒ තුළින් විශ්වාසීව ස්ථිර ලෙස ආදායම් ගණනය කළ හැකි ලෙස ආදායම් ඉපැයීම අදායම් ලෙස හඳුනා ගැනේ.

5.3 වියදම් හඳුනා ගැනීම

ආදායම් ප්‍රකාශනයෙහි වියදම් හඳුනාගෙන ඇත්තේ දරන ලද පිරිවැය සහ විශේෂිත වූ ආදායම් අයිතමයන්හි ඉපැයීම් අතර සෘජු සම්බන්ධතාවයෙහි පදනම මතය.

**6. අදාළ පාර්ශ්ව අතර ගනුදෙනු**

ගිණුම් ප්‍රකාශනයෙහි සඳහන් කාලය තුළ අදාළ පාර්ශ්ව අතර ගනුදෙනු කිසිවක් සිදුකර නොමැත.

**7. ශේෂ පත්‍ර දිනයට සිදුවීම් වලට අදාල පසු ගැළපුම් සටහන්**

මූල්‍ය වාර්තාවෙහි හෙළිදරව් කළ යුතු හෝ ගැළපීම් කළ යුතු ප්‍රමාණාත්මක සිදුවීම් ශේෂ පත්‍ර දිනට පසු සිදු වී නොමැත.

**8. ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් පරිදි ප්‍රමුඛ බැංකුවේ පැවති රු. 300,000.00 ක තැන්පතුව, ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ ගිණුමට මාරුකර ඇත.**

**9. ණයගැතියන් සඳහා අඩමාණ ණය ලෙස 2.5% ක් වෙන්කර තිබේ. 2006 වසරේ හඳුනානොගත් ණය ගැතියන් සඳහා අඩමාන ණය සම්පූර්ණයෙන් වෙන්කොට ඇත.**

**10. 10.1 සේවකයන් දෙදෙනෙකුට විරුද්ධව ආයතනය විසින් නීතිමය පියවර ගෙන ඇත.**

**10.2 මෙහි සඳහන් විගණන විමසුම් වලට අනුව 2.2.2 ඡේදය පරිදි ආයතනයේ වත්කම් නැවත ප්‍රති අගය 2018 වර්ෂයේදී සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.**

# ආදායම් ප්‍රකාශය

**2017 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

| | සටහන් | 2017<br>රු. | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|---|---|
| ආදායම් | **11** | **637,351,163.32** | **397,692,282.97** | **267,617,260.35** |
| සෘජු පිරිවැය | **12** | 541,297,909.69 | 342,085,817.84 | 229,795,974.66 |
| **දළ ලාභය / අලාභය** | | **96,053,253.63** | **55,606,465.13** | **37,821,285.69** |
| වෙනත් මෙහෙයුම් ආදායම් | **13** | 4,379,747.31 | 4,783,264.44 | 4,076,455.43 |
| | | **100,433,000.94** | **60,389,729.57** | **41,897,741.12** |
| පරිපාලන හා ආයතන වියදම් | **14** | (71,096,270.58) | (62,608,575.31) | (52,893,943.60) |
| ආලවිකරණ හා බෙදාහැරීමේ වියදම් | **15** | (26,231,866.42) | (17,086,815.43) | (16,402,573.28) |
| **මෙහෙයුම් කටයුතු වලින් ලද ලාභය** | | **3,104,863.94** | **(19,305,661.17)** | **(27,398,775.76)** |
| මූල්‍ය වියදම් | **16** | (124,084.60) | (180,985.45) | (152,403.98) |
| වෙනත් වියදම් | **17** | (1,770,342.59) | (6,142,345.59) | (986,284.07) |
| **බදු හර කිරීමට පෙර ශුද්ධ ලාභය / අලාභය** | | **1,210,436.75** | **(25,628,992.21)** | **(28,537,463.81)** |
| **බදු හර කල පසු ලාභය / අලාභය** | | **1,210,436.75** | **(25,628,992.21)** | **(28,537,463.81)** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් මත ලාභය | | | | |
| **වර්ෂය සඳහා මුළු මෙහෙයුම් ක්‍රියාකාරකම් මත ලාභය/අලාභය** | | **1,210,436.75** | **(25,628,992.21)** | **(28,537,463.81)** |

# ශේෂ පත්‍රය

**2017 දෙසැම්බර් මස 31 දිනට ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

| | සටහන් | 2017<br>රු. | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන** | | | | |
| දේපළ පිරියත හා උපකරණ | 18 | 11,170,153.95 | 12,608,937.31 | 18,479,716.12 |
| අස්පෘෂ්‍ය වත්කම් | 18-A | 3,460,377.76 | 3,999,830.83 | - |
| ගොඩනැගිලි වියදම් | | 3,684,124.10 | 5,526,186.14 | 7,368,248.18 |
| **මුලු ජංගම නොවන වත්කම්** | | **18,314,655.81** | **22,134,954.28** | **25,847,964.30** |
| **ජංගම** | | | | |
| ආයෝජන | 19 | 898,200.00 | 898,200.00 | 898,200.00 |
| වෙළඳ හා ලැබිය යුතු වත්කම් | 20 | 390,651,319.86 | 214,490,075.74 | 238,609,747.46 |
| තැම්පතු හා පෙරගෙවුම් | 21 | 1,662,656.66 | 1,944,593.80 | 752,235.75 |
| මුදල් හා සමාන දෑ | 22 | 31,416,455.80 | 8,559,416.92 | 8,685,944.63 |
| **ජංගම වත්කම්** | | **424,628,632.32** | **225,892,286.46** | **248,946,127.84** |
| **මුළු වත්කම්** | | **442,943,288.13** | **248,027,240.74** | **274,794,092.14** |
| **ස්කන්ධ හා වගකීම්** | | | | |
| **ස්කන්ධය** | | | | |
| රඳවාගත් ලාභය / අලාභය | | 70,209,475.81 | 57,883,448.68 | 98,854,157.55 |
| **මුළු ස්කන්ධය** | | **70,209,475.81** | **57,883,448.68** | **98,854,157.55** |
| **වගකීම්** | | | | |
| **ජංගම නොවන** | | | | |
| උපචිත පාරිතෝෂික දීමනා | 23 | 9,692,481.86 | 8,639,956.56 | 6,930,220.29 |
| කල්බදු ණය පොළී | 24 | - | - | - |
| මහාභාණ්ඩාගාර ණය | | - | 465,000.00 | 1,860,000.00 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **9,692,481.86** | **9,104,956.56** | **8,790,220.29** |
| **ජංගම** | | | | |
| කල්බදු ණය පොළී | 24 | - | - | 384,615.48 |
| වෙළඳ හා ගෙවිය යුතු වෙනත් වියදම් | 25 | 362,911,778.46 | 179,049,283.50 | 164,775,546.82 |
| මහාභාණ්ඩාගාර ණය | | - | 1,860,000.00 | 1,860,000.00 |
| අත්තිකාරම් ලැබීම් | | 129,552.00 | 129,552.00 | 129,552.00 |
| **මුළු ජංගම වගකීම්** | | **363,041,330.46** | **181,038,835.50** | **167,149,714.30** |
| **මුළු ස්කන්ධ හා වගකීම්** | | **442,943,288.13** | **248,027,240.74** | **274,794,092.14** |

මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් හඳුන්වාදෙන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති වලට හා 1971 අංක 38 දරණ මූල්‍ය පනතට අනුකූලව පිළියෙල කර ඇත.

සත්‍ය බවට අධ්‍යක්ෂකවරු විසින් සහතික කරන ලදී.

අත්සන් කලේ,



උමා රාජමන්ත්‍රී
සභාපතිනිය
සැලසිනෙ රූපවාහිනී ආයතනය

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**2017 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

| | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහය** | | |
| බදු හර කිරීමට පෙර ශුද්ධ ලාභය | 1,210,436.75 | (25,628,992.21) |
| **ගැලපීම්;** | | |
| බදු පොලී | - | 24,001.85 |
| පොලී ආදායම් | (99,309.82) | (145,449.20) |
| දේපල පිරියත හා උපකරණ මත ක්ෂය වෙන්කිරීම් | 4,001,678.11 | 4,353,470.40 |
| පාර්තෝෂික සඳහා වෙන් කිරීම් | 1,052,525.30 | 2,534,524.27 |
| දේපල අපහරණය කිරීමෙන් ලද ලාභය / අලාභය | 61,369.34 | - |
| පසුගිය වර්ෂයට අදාළ ගැලපීම් | 11,115,590.38 | (15,341,716.66) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය** | **17,342,290.06** | **(34,204,161.55)** |
| වෙළඳ හා අනෙකුත් ලැබීම් (වැඩිවීම් / අඩුවීම්) | (177,126,051.07) | 24,312,157.75 |
| තැම්පත් සහ කලින් කල ගෙවීම් (වැඩිවීම් / අඩුවීම්) | 281,937.14 | (1,192,358.05) |
| වෙළඳ ණය හිමියෝ හා අනෙකුත් ගෙවීම් (වැඩිවීම් / අඩුවීම්) | 183,862,494.96 | 14,273,736.68 |
| ලද අත්තිකාරම් (වැඩිවීම් / අඩුවීම්) | - | - |
| ගොඩනැගිලි වියදම් සඳහා ප්‍රතිපාදන (වැඩිවීම් / අඩුවීම්) | - | - |
| **මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල්** | **24,360,671.09** | **3,189,374.83** |
| පාර්තෝෂික ගෙවීම් | - | 824,788.00 |
| **මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල්** | **24,360,671.09** | **4,014,162.83** |
| **ආයෝජන කටයුතු වලින් ජනනය වූ මුදල්** | | |
| දේපල පිරිවිත, යන්ත්‍රාගාර හා උපකරණ මිලදී ගැනීම් | (1,602,942.02) | (2,482,522.42) |
| පොලී ආදායම් | 99,309.82 | 145,449.20 |
| ස්ථාවර තැම්පතු | - | - |
| **ආයෝජන කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල්** | **(1,503,632.20)** | **(2,337,073.22)** |
| **මූල්‍ය කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | |
| භාණ්ඩාගාර ණය ලැබීම් / ආපසු ගෙවීම් | - | (1,395,000.00) |
| ණය ආපසු ගෙවීම් | - | (408,617.33) |
| බදු ගෙවීම් නිවැරදි කිරීම් | - | - |
| **මූල්‍ය කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල්** | **-** | **(1,803,617.33)** |
| **මුදල් හා මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම / අඩුවීම** | **22,857,038.89** | **(126,527.72)** |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන් A) | 8,559,416.91 | 8,685,944.63 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන් A)** | **31,416,455.80** | **8,559,416.91** |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

## 2017 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

| | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|
| **සටහන A** | | |
| **මුදල් හා මුදල් සමාන දෑ** | | |
| ලංකා බැංකුව ජංගම ගිණුම් අංකය - 2323299 | 29,724,501.94 | 3,251,155.41 |
| ලංකා බැංකුව ඉතිරි කිරීමේ ගිණුම් අංකය - 2329765 | 291,145.04 | 1,662,698.51 |
| මහජන බැංකුව | 791,574.32 | - |
| නිශ්පාදන අත්තිකාරම් | 424,234.50 | 2,090,853.00 |
| අනෙකුත් අත්තිකාරම් | 185,000.00 | 1,554,710.00 |
| | **31,416,455.80** | **8,559,416.92** |

# ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීම

## 2017 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

| | 2017<br>රු. |
|---|---|
| | **රදවාගත් ලාභය** |
| 2017 ජනවාරි 1 දිනට ශේෂය | 57,883,448.68 |
| පෙර වර්ෂයට අදාල ගැලපීම් (සටහන 28) | 11,115,590.38 |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය / අලාභය | 1,210,436.75 |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **70,209,475.81** |

# මූල්‍ය වාර්තා සඳහා සටහන්

**2017 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

| | 2017<br>රු. | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|---|
| **සටහන - 11 - ආදායම්** | | | |
| නිශ්පාදන | 32,661,878.25 | 19,865,749.83 | 15,921,580.75 |
| ග්‍රැපික් | 48,299,073.00 | 13,492,843.62 | 21,276,109.47 |
| උපලේඛනගත කිරීම් | 405,675,446.93 | 314,834,334.00 | 193,993,826.89 |
| ඉසව් | 150,487,265.14 | 48,150,355.52 | 36,425,743.24 |
| වෙනත් | 82,500.00 | 84,000.00 | - |
| වෙබ් | 145,000.00 | 1,265,000.00 | - |
| | **637,351,163.32** | **397,692,282.97** | **267,617,260.35** |
| **සටහන - 12 - සෘජු පිරිවැය** | | | |
| නිශ්පාදන වියදම් | 28,656,917.64 | 17,141,833.00 | 12,756,525.65 |
| ග්‍රැපික් වියදම් | 33,511,635.16 | 13,965,362.04 | 19,381,442.68 |
| උපලේඛනගත වියදම් | 347,405,543.49 | 272,997,261.84 | 156,980,159.97 |
| ඉසව් කළමනාකරණ වියදම් | 131,586,313.40 | 36,804,690.96 | 40,677,846.36 |
| වෙබ් අඩවි වියදම් | 137,500.00 | 1,176,670.00 | - |
| වෙනත් වියදම් | - | - | - |
| | **541,297,909.69** | **342,085,817.84** | **229,795,974.66** |
| **සටහන - 13 - වෙනත් මෙහෙයුම් ආදායම්** | | | |
| සේවක ණය පොළී | 116,790.59 | 107,321.49 | 76,971.89 |
| බැංකු පොළී | 99,309.82 | 145,449.20 | 3,340,568.09 |
| වෙනත් ආදායම් | 3,531,849.90 | 4,425,393.75 | 281,000.00 |
| සැපයුම්කරුවන් ලියාපදිංචිය | 312,000.00 | 9,500.00 | 111,500.00 |
| පරිවර්තන ගාස්තු | - | 80,000.00 | - |
| නිර්මාණ ගාස්තු | 281,000.00 | - | 126,000.00 |
| ප්‍රවාහන ගාස්තු | 38,797.00 | 15,600.00 | 140,415.45 |
| | **4,379,747.31** | **4,783,264.44** | **4,076,455.43** |

# මූල්‍ය වාර්තා සඳහා සටහන්

## 2017 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

| | 2017<br>රු. | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|---|
| **සටහන - 14 - පරිපාලන හා ආයතන වියදම්** | | | |
| දීමනා - සභාපති | 1,547,928.00 | 1,500,000.00 | - |
| දීමනා - කොන්ත්‍රාත් | 945,924.66 | 712,150.00 | 500,000.00 |
| දීමනා - පුහුණු | 176,250.00 | 652,133.36 | 329,989.25 |
| දීමනා - ප්‍රවාහන | 900,000.00 | 560,000.00 | - |
| දීමනා - ඉන්ධන | 290,065.26 | 448,100.32 | 457,264.84 |
| දීමනා - දුරකතන | 156,000.00 | 156,000.00 | 119,964.29 |
| විගණන ගාස්තු | 120,000.00 | 110,000.00 | 192,120.00 |
| අධ්‍යක්ෂක මණ්ඩල දීමනා | 45,000.00 | - | - |
| ප්‍රසාද දීමනා | 662,125.00 | 680,500.00 | 720,000.00 |
| ගොඩනැගිලි වියදම් | 1,842,062.04 | 1,842,062.04 | 1,842,062.04 |
| ගොඩනැගිලි කුළී වියදම් - ජාතික චිත්‍රපටි සංස්ථාව | 3,780,000.00 | 3,780,000.00 | 3,780,000.00 |
| ගොඩනැගිලි කුළී වියදම් - රාජගිරිය කාර්යාලය | 733,335.84 | 565,390.32 | - |
| පිරිසිදු කිරීමේ හා සනීපාරක්ෂක වියදම් | 80,186.00 | 119,658.00 | 28,981.26 |
| පරිගණක අලුත් වැඩියා වියදම් | 26,480.00 | 118,041.11 | 37,178.89 |
| උපදේශක ගාස්තු | 50,000.00 | - | 15,000.00 |
| ක්ෂය වීම් | 2,641,533.37 | 2,230,019.53 | 2,092,213.70 |
| අධ්‍යක්ෂක වේතන | 505,500.00 | 647,483.33 | 1,187,364.28 |
| ආධාර | 553,400.00 | 453,199.56 | 68,000.00 |
| විදුලය | 790,952.95 | 462,481.24 | 297,898.14 |
| සේවක අර්ථ සාධක අරමුදල | 2,541,168.90 | 2,436,156.27 | 2,072,097.63 |
| සේවක අර්ථ සාධක අරමුදල | 507,727.05 | 429,730.96 | 414,419.84 |
| විදේශ ගමන් වියදම් | - | 298,759.80 | - |
| තෑගි වවුචර් වියදම් | 646,847.50 | 288,000.00 | 532,000.00 |
| පාරිතෝෂික දීමනා | 1,184,500.55 | 2,534,524.27 | 1,566,953.64 |
| අන්තර්ජාල වියදම් | 447,271.63 | 203,030.66 | 253,449.27 |
| කම්කරු වියදම් | 39,895.00 | - | - |
| වෙනත් වියදම් | 11,000.00 | - | 4,985.00 |
| පුවත්පත් මිලට ගැනීමේ වියදම් | 118,145.00 | 60,492.00 | 64,975.00 |
| අලුත් වැඩියා නඩත්තු - කාර්යාලීය උපකරණ | 79,135.00 | 81,088.00 | 350,300.00 |
| අල්ත් වැඩියා නඩත්තු - නිශ්පාදන උපකරණ | 672,398.47 | 96,466.00 | 217,653.39 |
| අධිභාර වියදම් | 102,564.57 | 6,510.20 | - |
| තැපැල් ගාස්තු | 28,970.00 | 38,141.00 | 37,375.48 |
| මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය | 1,475,598.52 | 1,534,437.69 | 802,975.27 |
| ගිවිසුම් අලුත් කිරීම | 12,000.00 | 27,500.00 | - |
| ලියාපදිංචි ගාස්තු | 90,665.00 | 119,000.00 | 74,540.00 |
| වැටුප් හා වේතන | 37,732,241.83 | 31,958,987.77 | 29,069,519.36 |
| ආරක්ෂක සේවා වියදම් | 1,073,830.00 | 1,151,172.00 | 657,600.00 |
| වෘත්තීය ගාස්තු | - | - | 140,000.00 |

# මූල්‍ය වාර්තා සඳහා සටහන්

## 2017 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

| | 2017<br>රු. | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|---|
| සාමාජීය සුභසාධන | - | 75,500.00 | 59,897.00 |
| ඉඩකඩ වෙන්කර ගැනීම (තාවකාලික) | 3,000.00 | - | - |
| සේවක රක්ෂණ | 2,545,397.07 | 1,451,568.31 | 1,282,879.58 |
| සේවක අතිකාල සහ යැපීම් දීමනා | 2,231,596.43 | 1,775,515.02 | 1,277,369.38 |
| සේවක සුභසාධනය | 868,703.05 | 793,292.59 | 506,004.59 |
| දුරකතන ගාස්තු | 577,366.85 | 515,270.46 | 382,777.86 |
| ටෙන්ඩර් ගාස්තු | 24,500.00 | 32,000.00 | 29,000.00 |
| පුහුණු කිරීමේ වැඩසටහන් | 118,250.00 | 447,865.60 | 50,000.00 |
| පරිවර්තන ගාස්තු | 209,800.00 | 261,500.00 | 137,350.00 |
| වාහන කුලී | 1,605,000.00 | 780,000.00 | 1,140,000.00 |
| පානීය ජලය | 284,155.04 | 156,927.90 | 76,334.02 |
| වෙබ් අඩවි යාවත්කාලීන කිරීමේ වියදම් | 17,800.00 | 17,920.00 | 25,450.00 |
| | **71,096,270.58** | **62,608,575.31** | **52,893,943.00** |

**සටහන - 15 - අලෙවිකරණ හා බෙදාහැරීමේ වියදම්**

| | | | |
|---|---|---|---|
| නිර්මාණ ගාස්තු | 2,001,522.00 | 95,000.00 | - |
| බොල්ණය | 2,994,377.69 | (601,208.77) | 2,398,952.77 |
| සම්බන්ධීකරණ ගාස්තු | 485,510.00 | 170,900.00 | - |
| මෝටර්රථ වාහන ක්ෂය වීම් | 708,191.67 | 1,567,164.80 | 1,567,164.80 |
| ඉන්ධන | 789,748.34 | 837,935.89 | 861,068.32 |
| මෝටර්රථ වාහන අළුත්වැඩියා වියදම් | 924,967.40 | 1,111,799.26 | 495,798.36 |
| මුද්‍රණ වියදම් | 68,254.00 | 14,587.00 | - |
| අලෙවි දිරි දීමනා | 1,748,539.59 | 921,832.46 | 783,132.78 |
| අලෙවි ප්‍රවර්ධන හා දැන්වීම් | 526,365.69 | 85,630.00 | 31,630.00 |
| විශේෂ වට්ටම් | 15,196,477.91 | 12,467,591.92 | 10,111,720.38 |
| විශේෂ ඉසව් කටයුතු වියදම් | 444,800.00 | - | - |
| ණය අයකර ගැනීමේ වියදම් | 5,000.00 | - | - |
| මුද්දර ගාස්තු | 16,355.40 | - | - |
| ප්‍රවාහන, ගමන් ගාස්තු හා නවතා තැබීම් | 174,448.82 | 215,143.96 | 75,921.74 |
| වාහන රක්ෂණ | 147,307.91 | 200,438.91 | 77,184.13 |
| | **26,231,866.42** | **17,086,815.43** | **16,402,573.28** |

**සටහන - 16 - මූල්‍ය වියදම්**

| | | | |
|---|---|---|---|
| බැංකු ගාස්තු | 103,220.70 | 134,538.70 | 61,433.53 |
| බලපත්‍ර හා රක්ෂණ ගාස්තු | 20,863.90 | 15,157.48 | 18,276.17 |
| කල්බදු පොලී | - | 24,001.85 | 72,694.28 |
| රැඳවුම් බද්ද | - | 7,287.42 | - |
| | **124,084.60** | **180,985.45** | **152,403.98** |

# මූල්‍ය වාර්තා සඳහා සටහන්

2017 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

| | 2017<br>රු. | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|---|
| **සටහන - 17 - වෙනත් වියදම්** | | | |
| ගිණුම්කරණ මෘදුකාංග | 309,998.00 | 214,331.00 | 211,804.00 |
| ජාලකරණ මෙහෙයුම් | 341,955.07 | 341,955.07 | 341,955.07 |
| සේවක වන්දි | - | 350,000.00 | - |
| වියදම් - රාජගිරිය කාර්යාලය | 187,260.18 | 33,208.00 | - |
| වත්කම් විකිණීමේ ලාභය / අලාභය | 61,369.34 | - | - |
| විවිධ වියදම් | 55,265.00 | 322,722.55 | - |
| නෛතික වියදම් | 797,130.00 | 730,800.00 | 351,375.00 |
| අනෙකුත් වියදම් | 17,365.00 | 4,149,328.97 | 81,150.00 |
| | **1,770,342.59** | **6,142,345.59** | **986,284.07** |

**සටහන - 18 - දේපල පිරියත හා උපකරණ**

| | 01.01.2017<br>දිනට පිරිවැය<br>රු. ශත. | එකතු කිරීම් /<br>මාරුකිරීම්<br>රු. ශත. | ඉවත් කිරීම් /<br>මාරුකිරීම්<br>රු. ශත. | 31.12.2017<br>දිනට පිරිවැය<br>රු. ශත. |
|---|---|---|---|---|
| **18.1 දළ වත්කම්** | | | | |
| ලීබඩු සහ සවිකිරීම් | 3,193,523.29 | 352,473.19 | 109,075.00 | 3,436,921.48 |
| පරිගණක උපාංග | 6,859,363.00 | 482,538.00 | - | 7,341,901.00 |
| කාර්යාල උපකරණ | 4,303,198.88 | 564,130.83 | - | 4,867,329.71 |
| මොටර් රථ | 9,080,824.00 | - | - | 9,080,824.00 |
| කැමරා සහ උපකරණ | 14,757,900.00 | 91,300.00 | - | 14,849,200.00 |
| | **38,194,809.17** | **1,490,442.02** | **109,075.00** | **39,576,176.19** |

| | 01.01.2017<br>දිනට ශේෂය<br>රු. ශත. | වර්ෂය සඳහා<br>ක්ෂය/<br>මාරු කිරීම්<br>රු. ශත. | ඉවත් කිරීම් /<br>ශේෂ ගැලපුම්<br>රු. ශත. | 31.12.2017<br>දිනට ශේෂය<br>රු. ශත. |
|---|---|---|---|---|
| **18.2 ක්ෂයවීම්** | | | | |
| ලීබඩු සහ සවිකිරීම් | 1,446,268.83 | 248,715.14 | 18,305.66 | 1,676,678.31 |
| පරිගණක උපාංග | 5,121,957.23 | 968,616.80 | - | 6,090,574.03 |
| කාර්යාල උපකරණ | 2,196,257.00 | 316,154.83 | - | 2,512,411.83 |
| මොටර් රථ | 8,749,422.60 | 708,191.67 | 511,269.00 | 8,946,345.27 |
| කැමරා සහ උපකරණ | 8,071,966.20 | 1,108,046.60 | - | 9,180,012.80 |
| | **25,585,871.86** | **3,349,725.04** | **529,574.66** | **28,406,022.24** |
| | **12,608,937.31** | | | **11,170,153.95** |

# මූල්‍ය වාර්තා සඳහා සටහන්

**2017 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

| | 01.01.2017 දිනට ශේෂය<br>රු. ශත. | වර්ෂය සඳහා ක්ෂය/ මාරු කිරීම්<br>රු. ශත. | ඉවත් කිරීම් / ශේෂ ගැලපුම්<br>රු. ශත. | 31.12.2017 දිනට ශේෂය<br>රු. ශත. |
|---|---|---|---|---|
| **සටහන - 18-A අස්පෘශ්‍ය වත්කම්** | | | | |
| ගිණුම්කරණ මෘදුකාංග | 2,621,500.00 | 112,500.00 | - | 2,734,000.00 |
| ජාලකරණ මෙහෙයුම් | 3,419,650.72 | - | - | 3,419,650.72 |
| | **6,041,150.72** | **112,500.00** | **-** | **6,153,650.72** |
| **ක්‍රමක්ෂය** | | | | |
| ගිණුම්කරණ මෘදුකාංග | 1,102,093.75 | 309,998.00 | - | 1,412,091.75 |
| ජාලකරණ මෙහෙයුම් | 939,226.14 | 341,955.07 | - | 1,281,181.21 |
| | **2,041,319.89** | **651,953.07** | **-** | **2,693,272.96** |
| | **3,999,830.83** | | | **3,460,377.76** |

# මූල්‍ය වාර්තා සඳහා සටහන්

**2017 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

| | සටහන් | 2017<br>රු. | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|---|---|
| **සටහන - 19 - ස්ථාවර තැම්පතු** | | | | |
| ලංකා බැංකුව - ගිණුම් අංකය 8162593 | | 500,000.00 | 500,000.00 | 500,000.00 |
| ණයකර - ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව | | 398,200.00 | 398,200.00 | 398,200.00 |
| | | **898,200.00** | **898,200.00** | **898,200.00** |
| **සටහන - 20 - වෙළඳ හා ලැබිය යුතු දෑ** | | | | |
| වෙළෙඳ ණය ගැතියෝ | **20.1** | 365,368,348.55 | 190,632,488.52 | 211,319,015.75 |
| උත්සව අත්තිකාරම් | | 40,000.00 | 271,500.00 | 203,000.00 |
| සේවක ණය | | 2,995,587.95 | 2,555,730.00 | 1,506,668.50 |
| වැටුප් අත්තිකාරම් | | 21,000.00 | 21,000.00 | 21,000.00 |
| ලැබිය යුතු රක්ෂණ වාරික | | 171,625.16 | 224,731.81 | 103,866.72 |
| සේවකයන්ගෙන් ලැබිය යුතු - වෙනත් | | 496,388.20 | - | - |
| බැංකු ඇපකර | | 1,179,738.08 | 693,237.91 | 979,868.68 |
| රඳවා ගැනීමේ බදු | | 2,212.74 | - | 5,917,583.31 |
| ආර්ථික සේවා ගාස්තු | | 3,599,744.00 | 3,599,744.00 | 3,599,744.00 |
| උපාලි පුවත්පත් සමාගම | | 10,695.00 | 10,695.00 | 10,695.00 |
| ලැබිය යුතු දඩ හා අධිභාරය | | 199,067.50 | 148,333.72 | (10,036.10) |
| අවිනිශ්චිත ගිණුම | | 76.63 | - | - |
| එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම | | 2,538,028.86 | 2,538,028.86 | 2,538,028.86 |
| විජය පුවත්පත් සමාගම | | 188,650.74 | 188,650.74 | 188,650.74 |
| ඊවීජී | | 3,004.00 | 3,004.00 | 3,004.00 |
| ලැබිය යුතු කොමිස් මුදල - ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | | 63,558.00 | 63,558.00 | 63,558.00 |
| ආපසු ගෙවන තැන්පතු | | 1,327,000.00 | 1,312,000.00 | 110,000.00 |
| සෙලින්කෝ රක්ෂණ | | 41,800.00 | 41,800.00 | 41,800.00 |
| ලැබිය යුතු බැංකු පොලී | | 59,730.00 | 39,819.68 | 25,300.00 |
| සේවක මුදල් වංචාව | **20.2** | 11,988,000.00 | 11,988,000.00 | 11,988,000.00 |
| විවිධ ලැබීම් | | 1,647.10 | 140,251.50 | - |
| ඊ-මංසල පාලන ගිණුම | | 355,417.35 | 17,502.00 | - |
| | | **390,651,319.86** | **214,490,075.74** | **238,609,747.46** |
| **සටහන - 20.1 - වෙළෙඳ ණයගැතියෝ** | | | | |
| වෙළෙඳ ණයගැතියෝ | | 377,742,663.24 | 200,012,425.52 | 221,300,161.52 |
| අඩු කලා - බොල් ණය සඳහා වෙන් කිරීම් | | 12,374,314.69 | 9,379,937.00 | 9,981,145.77 |
| | | **365,368,348.55** | **190,632,488.52** | **211,319,015.75** |

**සටහන - 20.2 - සේවක මුදල් වංචාව**

ආයතනයේ සේවකයන් විසින් නිසි අධිකාරියකින් තොරව මුදල් ලබාගෙන කරන ලද මූල්‍ය වංචාව පිළිබඳව පොලිස් මූල්‍ය අපරාධ අංශය මගින් විමර්ශන කටයුතු සිදු කරනු ලැබේ. ඒ අනුව මෙම මුදල් අදාල පාර්ශ්වයන්ගෙන් අයකර ගැනීමට අදාළ නීතිමය කටයුතු කරගෙන යනු ලැබේ.

# මූල්‍ය වාර්තා සඳහා සටහන්

## 2017 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

| | 2017<br>රු. | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|---|
| **සටහන - 21 - තැන්පතු හා පෙර ගෙවීම්** | | | |
| වාහන සඳහා කලින් ගෙවීම් | - | - | - |
| කලින් කල ගෙවීම් | 1,662,656.66 | 1,944,593.80 | 752,235.75 |
| | **1,662,656.66** | **1,944,593.80** | **752,235.75** |
| **සටහන - 22 - මුදල් මුදල් සමාන දෑ** | | | |
| ලංකා බැංකුව ගි.අ. 2323299 | 29,724,501.94 | 3,251,155.41 | 1,063,567.06 |
| ලංකා බැංකුව ඉතිරි කිරීමේ ගි.අ. 2329765 | 291,145.04 | 1,662,698.51 | 5,798,251.57 |
| මහජන බැංකුව ගි.අ. 200100130005980 | 791,574.32 | - | - |
| නිෂ්පාදන අත්තිකාරම් | 424,234.50 | 2,090,853.00 | 1,595,626.00 |
| වෙනත් අත්තිකාරම් | 185,000.00 | 1,554,710.00 | 228,500.00 |
| | **31,416,455.80** | **8,559,416.92** | **8,685,944.63** |
| **සටහන - 23 - ගෙවිය යුතු පාරිතෝෂික** | | | |
| ඉ / ගෙ ශේෂය | 8,639,956.56 | 6,930,220.29 | 5,490,466.65 |
| පාරිතෝෂක වියදම් වර්ෂය සඳහා | 1,052,525.30 | 2,534,524.27 | 1,566,953.64 |
| | 9,692,481.86 | 9,464,744.56 | 7,057,420.29 |
| පාරිතෝෂක ගෙවීම් | - | 824,788.00 | 127,200.00 |
| **ගෙවිය යුතු පාරිතෝෂක** | **9,692,481.86** | **8,639,956.56** | **6,930,220.29** |

# මූල්‍ය වාර්තා සඳහා සටහන්

2017 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

සටහන - 24 පොලී ගෙවිය යුතු ණය හා ණය ගැනීම්

| | 2016 වසර 1 ක් තුළ මුදල් ආපසු ගෙවිය යුතු | 2016 වසරකට පසුව ආපසු ගෙවිය යුතු | 2016 මුළු එකතුව |
|---|---|---|---|
| මූල්‍ය බදු | - | - | - |
| | - | - | - |

සටහන - 24.1 මූල්‍ය බදු

| | 01.01.2017 දිනට | ලබාගත් නව බදු | ආපසු ගෙවීම් | 31.12.2017 දිනට |
|---|---|---|---|---|
| ලංකා බැංකුව | | | | |
| මිට්සුබිසි වෑන් රථය | - | | - | - |
| | - | - | - | - |
| | - | - | - | - |

සටහන - 24.2 අනාගත කාලසීමාව සඳහා වෙන්කල මූල්‍ය ගාස්තු

| | 01.01.2016 දිනට | ලබාගත් නව බදු | ආපසස ගෙවීම් | 31.12.2017 දිනට |
|---|---|---|---|---|
| ලංකා බැංකුව | | | | |
| මිට්සුබිසි වෑන් රථය | - | - | - | - |
| | - | - | - | - |
| | - | | | - |

# මූල්‍ය වාර්තා සඳහා සටහන්

**2017 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

**සටහන - 25 - වෙළෙඳ හා අනිකුත් ගෙවිය යුතු දෑ**

| | 2017<br>රු. | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|---|
| වෙළෙඳ ණයහිමියෝ | 239,504,342.38 | 113,449,211.21 | 108,960,599.32 |
| සේවක අර්ථසාධක අරමුදල | - | - | 35,151.05 |
| දුරකතන ගාස්තු | 47,302.86 | 47,302.86 | 83,920.15 |
| සේවක භාරකාර අරමුදල | - | - | 3,383.33 |
| ගෙවිය යුතු අලෙවි කොමිස් | 716,321.22 | 110,000.00 | - |
| අතිකාල හා යැපීම් දීමනා | - | - | 199,204.00 |
| උපචිත මුද්දර ගාස්තු | 1,375.00 | - | - |
| සනස සමිතිය | - | - | 43,120.00 |
| උපචිත ගෙවිය යුතු බද්ද | 4,830.12 | - | - |
| ජලය | - | - | 11,373.62 |
| එකතුකල අගය මත බද්ද | 54,853,633.70 | 19,311,617.86 | 19,507,924.21 |
| විදුලිය | - | - | 114,371.70 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 18,466,322.67 | 14,703,471.72 | 13,376,476.63 |
| ගෙවිය යුතු ගෙවල් කුළී | 900,000.00 | 900,000.00 | - |
| ආර්ථික සේවා ගාස්තු | - | - | - |
| වෙනත් ණය හිමියෝ | 1,885,523.10 | 4,061,815.30 | 293,212.65 |
| විගණන ගාස්තු | 174,000.00 | 172,500.00 | 70,000.00 |
| ඉන්ධන | 41,651.47 | 41,651.47 | 41,651.47 |
| ගෙවිය යුතු වැටුප් | - | - | 143,960.83 |
| වැටුප් පාලන ගිණුම | 11,458.16 | - | - |
| උපචිත වියදම් | 46,305,017.78 | 26,251,713.08 | 21,867,195.68 |
| ගෙවිය යුතු කල්බදු වාරික | - | - | 24,001.73 |
| | **362,911,778.46** | **179,049,283.50** | **164,775,546.82** |

# මූල්‍ය වාර්තා සඳහා සටහන්

**2017 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

**සටහන - 26 - සම්බන්ධිත පාර්ශවයන් හෙලිදරව් කිරීම (LKAS 24)**

| නම | තනතුර | සම්බන්ධතා පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ ස්වභාවය | ලිපිනය |
|---|---|---|---|
| උමා රාජමන්ත්‍රී | සභාපතිනිය | නැත | අංක. 22/02, රොස්මන්ඩ් පෙදෙස, කොළඹ 07. |
| මංජුල හේරත් | සාමාන්‍යාධිකාරී | නැත | අංක. 52, කොම්පෙයාහේන පාර, හෝමාගම |

2017 මුදල් වර්ෂය සඳහා සැලසිනෙ රූපවාහිනී ආයතනය සහ ඉහත දැක්වෙන එක් එක් පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සමග සම්බන්ධතා පාර්ශ්ව ගනුදෙනු සිදුනොවීය.

**සටහන - 27 - ගොඩනැගිලි අලුත්වැඩියා වියදම්**

ගොඩනැගිලි අදුත්වැඩියා සඳහා දරන ලද වියදම් තුළ මූලධන ස්වරූපයේ වියදම් ද ඇතුළත් බැවින්, ආයතනය විසින් බදුකරු සමඟ ඇති කරගත් ගිවිසුම වලංගු වසර 5 ක කාලය තුළ ලියා හැරීමට කටයුතු කර ඇත.

**සටහන - 28 - පෙර වර්ෂයේ ගැලපීම්**

| | |
|---|---:|
| ක්ෂය නිවැරදි කිරීම | 511,269.00 |
| ණයගැතිශේෂ නිවැරදි කිරීම | (185,825.00) |
| උපචිත වියදම් නිවැරදි කිරීම | 11,514,413.74 |
| ලෙජර් ගිණුම නිවැරදි කිරීම | 131,811.07 |
| අධිභාර දණ්ඩන නිරවුල් කිරීම | (812,458.68) |
| අත්තිකාරම් නිවැරදි කිරීම | (334,630.00) |
| ණයහිමියන් නිරවුල් කිරීම | 291,010.25 |
| | **11,115,590.38** |

# 2017 වසරේ මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳව විගණකාධිපතිතුමාගේ මතය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සීජ්එස්/ඩී/එස්ටීඅයි/05/17/173 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2018 නොවැම්බර් 09 දින

සභාපති,

සැලසිනෝ රූපවාහිනී ආයතනය.

**සැලසිනෝ රූපවාහිනී ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව**

---

සැලසිනෝ රූපවාහිනී ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සැලසිනෝ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරිම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරිම්වලදි, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 ආයතනය පිහිටුවීම

---------------------

මෙම ආයතනය 2001 දෙසැම්බර් 20 දින මහවැලි අධිකාරියෙන් ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පවරා ගෙන තිබුණත්, එහි අරමුණු හා කාර්යයන් නිශ්චය කර බලතල ක්‍රියාත්මක කිරීමට පනතකින් හෝ වෙනයම් නීතියකින් විධිවිධාන සලසා නොතිබුණි. මෙම ආයතනය “සැලසිනේ ලිමිටඩ් “ලෙස සමාගම් පනත යටතේ පොදු සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමට 2009 වර්ෂයේ සිට කටයුතු කරමින් තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.

## 1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE

3

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සැලසිනේ රූපවාහිනී ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1

ප්‍රමිතයේ 48 ඡේදය අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයක් මඟින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටක හැර ආදායම් හා වියදම් සහ වත්කම් හා වගකීම් හිලව් කිරීම සිදු නොකළ යුතු වුවත් ආයතනය විසින් එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ ගෙවිය යුතු බදු රු.186,181,686 ක් ලැබියයුතු බදු රු.112,861,729 කට හිලව් කර ගෙවියයුතු ශේෂය ලෙස රු.73,319,957 ක් පමණක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7

ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.13,041,759 ක් වූ කාණ්ඩ 05 කට අයත් වත්කම්, සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුනි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ලී බඩු උපකරණ හා පරිගණක උපකරණ ක්ෂය කිරීමේදී පිළිවෙලින් සියයට 10 ක හා සියයට 20 ක ක්ෂය අනුපාතය යටතේ ක්ෂය කිරීම සිදුකර තිබුණද පිළිවෙලින් වසර 2 ත් වසර 10 ත් හා වසර 3 ත් වසර 05 ත් අතර පරාසයක ක්ෂය කරන බවට ගිණුම්කරණ ප්‍රතිපත්තිවල දක්වා තිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ හිටපු ක්‍රියාකාරී අධ්‍යක්ෂ ලෙස පත්කර තිබූ නිලධාරියෙකු වෙනුවෙන් 2016 අප්‍රේල් 27 සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙවන ලද රු.71,502 ක් පෙර වර්ෂයේ ලාභයට ගැලපීම වෙනුවට වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ආ) මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යාංශයෙන් 2004 වර්ෂයේදී ආධාරයක් ලෙස ලැබී 2011 වර්ෂයේ ආයතනයට පවරා ගෙන දැනට භාවිත කරමින් පවතින කැබ් රථයක් 2017 දෙසැම්බර් 31 දින දක්වා වූ වසර 13 ක කාලයක් භාවිතා කර තිබුණද එම වත්කම තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2009 හා 2011 වර්ෂවලදී පිළිවෙලින් රු.115,300 කට හා රු.115,500 කට මිලදී ගෙන තිබූ කැමරා හා වීඩියෝ උපකරණ සඳහා වාර්ෂික ක්ෂය පිළිවෙලින් රු.11,530 ක් හා රු.11,550 ක් වුවද වර්ෂයකට පිළිවෙලින් රු.2,306 ක් හා රු.6,930 ක් බැගින් ක්ෂය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශුද්ධ අගය පිළිවෙලින් රු. 83,016 කින් හා රු.32,340 කින් වැඩියෙන්ද වර්ෂයේ ක්ෂය රු.9,224 කින් හා රු.4,620 කින් අඩුවෙන් ද දක්වා තිබුණි.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

එකතු කළ අගය මත බදු සඳහා වූ ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් නිරවුල් නොකර පෙර වර්ෂයන් හි සිට ඉදිරියට ගෙනවිත් තිබුණද ඒ සඳහා කාල විශ්ලේෂණ ලබා දී නොතිබුණි. මෙම හේතුව නිසා වර්ෂය තුළ ගෙවූ හා ලැබූ නිවැරදි බදු ප්‍රමාණයන් තහවුරු නොවිය. එසේම පෙර වර්ෂවල සිට ගෙවිය යුතු බදු ශේෂ නිරීක්ෂණය වුවද, වර්ෂය තුළ බදු ගෙවීම් කිසිවක් නිරීක්ෂණය නොවීය. 2017 දෙසැම්බර් 31 දිවට බදු ගිණුමේ ශේෂය රු.54,853,633 ක් විය.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැති ශේෂය රු.377,742,663 ක් වූ අතර ඒ තුළ ඇතුළත් වසර 03 ඉක්මවූ ණයගැති ශේෂය මුළු ණයගැතියන් ගෙන් සියයට 25 ක් එනම් රු.95,729,558 ක් වී තිබුණි. වසර 03 ඉක්මවූ මෙම ණයගැති ශේෂයෙන් ණයගැතියන් 42 දෙනෙකුට අදාළ රු.මිලියන 89 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු අයකිරීමක් සිදුවී නොතිබුණි.

(ආ) සේවයෙන් ඉවත්වූ නිලධාරිණියකට ගෙවා තිබූ රු.21,000 ක් වූ වැටුප් අත්තිකාරම් මුදල 2014 දෙසැම්බර් 31 දින සිට වසර 03 කට අධික කාලයක් ගත වී තිබුණද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 103 (1) (ඇ) හා 104 (1) (අ) | සමාලෝචිත වර්ෂයේදී සිදු වූ වාහන අනතුරු 2 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිමත් පරීක්ෂණ පවත්වා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 110 | හානි පිළිබඳ විධිමත් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 හා 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008(I) දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛ | සියළුම රාජ්‍ය ආයතන වල පුරවැසි ප්‍රඥප්තිය සකස් කිරීම සිදුකළ යුතු වුවද ආයතනය විසින් පුරවැසි ප්‍රඥප්තිය සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

ජාතික විගණන කාර්යාලය
NAOSL NATIONAL AUDIT OFFICE

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,210,436 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ අලාභය රු.25,628,992 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.26,839,428 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. සෘජු වියදම් රු.199,212,092 කින් වැඩි වුවද ආදායම රු.239,658,881 කින් වැඩිවීම ඉහත වර්ධනය කෙරෙහි බලපා තිබුණි.

සාලොචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 හා 2017 වර්ෂවල මූල්‍ය අතිරික්තයක්ද 2014, 2015 හා 2016 වර්ෂවල මූල්‍ය ඌනතාවයක්ද ඇති වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය වීම් නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.36,182,489 ක් වූ ධන දායකත්වය උච්ඡාවචනයන් සහිතව 2017 වර්ෂයේදී රු.55,447,319 ක් තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් 2002 පෙබරවාරි මාසයේ සිට 2009 දෙසැම්බර් මාසය දක්වා වූ කාලයට අයත් මාස 28 ක සේවක අර්ථ සාධක අරමුදල් නියමිත දිනට නොගෙවීම නිසා රු.812,459 ක දඩ මුදල් ප්‍රමාණයක් ගෙවීමට සිදුවී තිබුණි. 2011 ජනවාරි 14 දිනැති අංක 19643 / AC දරන මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කොමසාරිස් ගේ ලිපිය අනුව, ඉහත මුදල රු.81,245 බැගින් වූ වාරික 10 කින් ගෙවා නිම කිරීමට අනුමැතිය ලබා දී තිබූ අතර 2017 අගෝස්තු මාසයේ සිට 2017 දෙසැම්බර් දක්වා රු.406,229 ගෙවා තිබුණි. ආයතනයේ මුදලින් ගෙවා තිබූ මෙම දඩ මුදල් අර්ථසාධක අරමුදල් ගෙවීම සඳහා ප්‍රමාදවීම් වලට වගකිව යුතු නිලධාරීන්ගෙන් අය කර ගතයුතු වුවත් එසේ අයකර නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE
NAOSL

7

(ආ) දුර්වල මූල්‍ය කළමනාකරණය, අභ්‍යන්තර පාලනයේ දුර්වලතාව හා අභ්‍යන්තර විගණනය ක්‍රමානුකූලව ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ආයතනයේ අභ්‍යන්තර විගණන නිලධාරී ලෙස බඳවා ගෙන තිබූ නිලධාරිනිය විසින් 2014 වර්ෂයේ දී රු.11,988,000 ක මූල්‍ය වංචාවක් සිදු කර තිබුණි. එසේ වුවද අදාල පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් නොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වගකිව යුතු පාර්ශවයෙන් කිසිදු මුදලක් අයකර නොතිබුණි.

## 4.2 කාර්යමණ්ඩල පරිපාලනය

ආයතනය විසින් 2015 අප්‍රේල් 09 දින සිට අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ පෞද්ගලික නීති උපදේශක තනතුර සඳහා නිළධාරියෙකු බඳවාගෙන 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා දීමනා හා ගාස්තු වශයෙන් අනුමැතියකින් තොරව රු.849,000 ක මුදලක් ගෙවා තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය " ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධව තිරසාර සංවර්ධන අරමුණු , ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගෙන නොතිබුණි.

## 6. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සැලසිනේ රූපවාහිනී ආයතනය විසින් 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ දින 140 ක ප්‍රමාදයකින් පසුව 2018 ජූලි 18 දිනදීය.

# 2017 වර්ෂයේ විගණකාධිපතිතුමාගේ වාර්තාව සඳහා පිළිතුරු

**සැලසිනෙ රූපවාහිනී ආයතනයේ 2017 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව සඳහා පැහැදිලි කිරීම්**

**1.4) ආයතනය පිහිටුවීම.**

මෙම ආයතනය පිහිටුවීම සඳහා නීතිමය ප්‍රතිපාදන ඇති කිරීමට අදාල කටයුතු සැලකිය යුතු මට්ටමකට නිමකර ඇති අතර, ජනමාධ්‍ය හා මුදල් අමාත්‍යංශය යටතට පත්වීමෙන් අනතුරුව රජයට අයත් සීමිත පොදු සමාගමක් ලෙස පත් කිරීමට කැබිනට් පත්‍රිකාවක් 2014 වර්ෂයේ ඉදිරිපත් කර ඒ සඳහා කැබිනට් මණ්ඩල අනුමැතියද ලබාගෙන මුදල් අමාත්‍යංශය වෙත ඉදිරිපත් කර ඇත.මේ සම්බන්ධයෙන් භාණ්ඩාගාරය සමග සාකච්ඡා පවත්වමින් සිටින අතර, මෙම තත්වයට පිළියමක් ඉතා නුදුරේම ලබා ගැනීමට ආයතනය අපේක්ෂා කරනු ලැබේ.

**2.2) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1

එකතු කල අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු ලැබීම් හා ගෙවීම් 2018 වර්ෂයේ දී වෙනම දැක්වීමට කටයුතු කරනු ලැබේ.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7

ශූන්‍ය වූ අගයන් සහිත වත්කම් දැනට භාවිත කරන අතර, 2017 වසරේ අවසන් ගිණුම් සටහන් අංක 11.2 අනුව වත්කම් අගය කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ සහය ලබා ගැනීමට කටයුතු කර ඇති අතර, 2018 වර්ෂයේ අවසාන ගිණුම් පිළියෙල කිරීමේ දී අදාල අගයන් ගිණුම් වලට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

**2.2.2) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ක්ෂය කිරීමේ ගිණුම් ප්‍රතිපත්තිය 2013 වසරේ දී වෙනස් කරන ලද අතර, ගිණුම් එම වර්ෂයේ සිට වසර 10 කට සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂය කරන ලදි.එම වරද 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

**2.2.3) ගිණුම්කරණ අඩුපාඩු**

(අ) රඳවාගත් ලාභයට ගලපා 2018 වර්ෂයේදී එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) මෙම කැබ් රථය 2012 වර්ෂයේදී රු.1,950,000/- කට තක්සේරු කොට ගිණුම් පොත් වලට ඇතුළත් කර ඇත.

(ඇ) 2013 වර්ෂයේදී කරන ලද කෂය අනුපාත වෙනස් කිරීමේ දී 31.12.2012 දක්වා කරන ලද ක්ෂය වත්කමේ මුළු පිරිවැයෙන් අඩුකර ශුද්ධ වර්තමාන අගය වත්කම් අගය ලෙස සලකා ක්ෂය කර ඇත.

**2.2.4) විගණන සඳහා සාක්ෂි නොවීම.**

2016 වර්ෂයට අදාළ ලිපිගොනුව රාජ්‍ය විගණන අංශය වෙත ලබාදුන් අතර, එය නැවත සැලසිනෙ ආයතනයට නොලැබිණි.පෙර වර්ෂවල බදු ගෙවීම් වල සියළු විස්තර එහි අන්තර්ගත විය.

**2.3) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) මෙම ණයගැති ශේෂයන් පියවන ලෙස එම සේවාදායකයන් වෙත නිතිපතා දැනුම් දීම සිදු කරනු ලබයි.පසුගිය පාලන අධිකාරිය විසින් මෙම ණයගැතියන් සම්බන්ධව සිදු කරන ලද ගණුදෙනු වලට අදාලව නිසි අනුමැතිය ලබා නොගැනීම ආයතන වල ප්‍රධානීන් වෙනස් වීම නිසා ඒ පිළිබඳ දැනුවත් පාර්ශ්වයන් නොමැති වීම වැනි හේතු මුදල් අයකර ගැනීමට කටයුතු කිරීමේ දී ප්‍රශ්න මතු වී ඇත.බාහිර සැපයුම්කරුවන් විසින් කටයුතු කිරීමේ දී නිවැරදිව ඉටු නොකිරීම නිසා සේවාදායක ගෙවීම් සිදු නොකිරීමට හේතු වී ඇත.මෙම ණය ලබා ගැනීමට සෑම විටම උත්සාහ ගනු ලබන අතර, ණයශේෂ පියවන ලෙස වරින්වර දැනුම්දීම සිදු කරනු ලැබේ.මෙයට අමතරව අදාල ආයතන ප්‍රධානීන්ගේ අවධානයටද මෙම ණයගැති ශේෂයන් යොමුකර ඇත.

ආ) සේවයෙන් ඉවත් වූ නිලධාරිනියට ගෙවන ලද රු. 21,000/- ක වැටුප් අත්තිකාරම 2018 වර්ෂයේ දී නිරවුල් කරන ලදි.

**2.4) නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම.**

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

(1) සමාලෝචිත වර්ෂයේ දී, සිදු වූ වාහන අනතුරු අතරින් රු.189,250/- ක අනතුරට අදාළව මු.රෙ ප්‍රකාරව පරීක්ෂණ කටයුතු සිදු කර ඇත.එම හානි සම්බන්ධයෙන් හානිපාඩු ලේඛණයට ඇතුළත් කර ඇති අතර, රක්ෂණ ආයතනයෙන් සිදු වූ හානිය ආවරණය කර ගැනීමට කටයුතු කර ඇත. වාහන අලුත් වැඩියා සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කරනු ලැබේ.අභ්‍යන්තර අලාභ සම්බන්ධයෙන් ලියාපදිංචි ගරාජ වලින් අලුත් වැඩියා සිදු කරනු බවද සඳහන් කරමි.

(11) හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගෙන යන අතර, එය ඔබගේ පරීක්ෂාව සඳහා ඉදිරිපත් කල හැක.

(ආ) අංක 05/2008, හා අංක 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ගේ චක්‍රලේඛයේ සඳහන් පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය මෙම ආයතනයේ ක්‍රියාත්මක වූවාද යන්න පිළිබඳව කිසිදු තොරතුරක් හෝ ලිපි ගොනුවක් සොයා ගැනීමට නොමැත.

එබැවින්, අංක 05/2008 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2.4 පරිච්ඡේදයේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ප්‍රඥප්තිය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නිළධාරීන් අවශ්‍ය පුහුණුව හා දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බවට දන්වා ඇත. ඉදිරි කාලයේ දී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් විමසා සුදුසු නිලධාරීන් යවා පුහුණුවක් ලබාදීමෙන් පසුව පුරවැසි ප්‍රඥප්තිය සකස් කිරීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන් වෙත උපදෙස් ලබාදුන් බව කාරුණිකව දන්වා සිටිමි.

## 3) මූල්‍ය සමාලෝචනය

### 3.1) මූල්‍ය ප්‍රතිඵල

ආයතනයේ පිරිවැටුම 2016 වසර හා සැසඳීමේ දී රු.මි.240කින් වැඩි වීම නිසා එහි ප්‍රතිඵලයක් ලෙස දල ලාභය ද රු.මි.41.0කින් වැඩිකර ගැනීමට හැකි වූ අතර, මූල්‍ය හා අනෙකුත් වියදම් සකසුරුවම් ලෙස පාලනය කිරීම නිසා එම වියදම් රු.මි.4.4 කින් 2016ට වඩා අඩුවිය.එහි ප්‍රතිඵලයක් ලෙස රු.මි.1.2ක ශුද්ධ ලාභයක් අත්පත් කරගැනීමට 2017 වර්ෂයේ දී හැකිවිය.

## 4) මෙහෙයුම් සමාලෝචනය

### 4.1) කළමනාකරණ ක්‍රියාකාරම්

(අ) අර්ථ සාදක අරමුදල් සම්බන්ධයෙන් 2002- 2009 දක්වා කාලයට අදාළව රු.812,459 ක අධිභාරයක් සේවක අර්ථ සාදක අරමුදල විසින් අධිභාරයක් පනවා තිබුණි. එම කාල වකවානුව තුල ආයතනයට විවිධ මූල්‍ය ගැටළු හා දුෂ්කරතා වලට මුහුණ දීමට සිදුවීම නිසා කලට වේලාවට එකී මුදල් සේවක අර්ථ සාදක අරමුදල වෙත ප්‍රේෂණය කිරීමට නොහැකි වී ඇත. එය නිලධාරියෙකුගේ අතින් සිදු වූ වරදක් නොවන බැවින්, මාසික වාරික වශයෙන් කම්කරු කොමසාරිතුමාගේ අනුමැතිය ලබාගෙන හිඟ මුදල් සියල්ල කම්කරු කොමසාරිස් වෙත ප්‍රේෂණය කිරීමට පෙර පැවති පාලන අධිකාරිය කටයුතු කරන ලදි.

(ආ) ආයතනයේ අභ්‍යන්තර පාලනයේ දුර්වලතා හේතු කොටගෙන අභ්‍යන්තර විගණන නිලධාරී විසින් සිදු කරන ලද මුදල් වංචාව පිළිබඳව එවකට සිටි පාලන අධිකාරිය කුරුඳු වත්ත පොලිස් ස්ථානයේ ඊට අදාල පැමිණිල්ලක් සිදු කරන ලද අතර, ඊට අදාළ අභ්‍යන්තර සාක්ෂි විමසීම් සිදු කර ඇත.මෙය සිදු වෙමින් පවතින අවස්ථාවේ දී මෙම නිලධාරිනිය සේවයෙන් ඉවත්ව ගොස් ඇත. දැනට මෙම අලාභය සම්බන්ධව මූල්‍ය අපරාධ විමර්ශන අංශයේ පැමිණිල්ලක් සිදු කර ඇති අතර, එම අංශය මගින් විමර්ශන කටයුතු දැනට සිදු කරමින් පවතී.

### 4.2) කාර්යමණ්ඩල පරිපාලනය

2015 වර්ෂයේ නව රජය බලයට පත් වීමෙන් පසුව මූල්‍ය අක්‍රමිකතා සෙවීම සම්බන්ධව විශේෂ මූල්‍ය වංචා විමර්ෂන ඒකකයක් පත් කරන ලදි.ඒ වන විට මෙම කාර්යාලය හා සම්බන්ධව මූල්‍ය වංචා විශාල ප්‍රමාණයක් වාර්ථා වී තිබුණ අතර, ඒ සඳහා එම ඒකකය මගින් දිනපතාම පාහේ නිලධාරීන් පැමිණ කටඋත්තර ගැනීම් විමර්ෂණ සිදු කිරීම් මෙන්ම මෙම කාර්යාලයට අයත් අවුරුදු පහක පමණ කාලයක මූල්‍ය ලිපිගොනු එම ආයතනය භාරයට (FCID) ගන්නා ලදි.

එසේම කාර්යාලයේ අභ්‍යන්තර විමර්ෂණ, කම්කරු විනිශ්චය සභාවේ විභාග වන නඩු, කොළඹ වාණිජ මහ අධිකරණයේ විභාග වන නඩු, කම්කරු දෙපාර්තමේන්තුවේ විභාග වන නඩු විශාල ප්‍රමාණයක් ගොඩගැසී නොවිසිඳා තිබුණු අතර, ඒවා සඳහා දැනුමක් ඇති කිසිවෙකු නොමැති වූ බැවින්, එම කටයුතු අඩපන වී මන්දගාමීව පැවතුනි.ඒ හේතුවෙන් විශාල වැය ප්‍රමාණයක් කාර්යාලයට දැරීමට සිදුව තිබුණි.

එබැවින්, ඉතා කඩිනමින් එම නඩු කටයුතු පිළිබඳ උපදෙස් ලබා ගැනීමට තාවකාලික පියවරක් ලෙස සුදුසුකම් ලත් නීතීඥ මහතෙකුගේ සේවය ලබාගෙන ඇත.වර්තමානයේ මෙවැනි කටයුතු පිළිබඳව නීතීඥ මහතුන්ගේ සහය ලබා ගැනීමට යෑමේදී ඔවුන් විසින් අයකරනු ලබන විශාල මුදල් කන්දරාවක් පිළිබඳ සැලකීමේ දී අප ආයතනයට පත් කල නීතීඥ මහතාට ගෙවා ඇත්තේ ඉතාමත්ම අඩු ගාස්තුවක් බව පෙන්වා දෙමි.

2. ඉහත නිලධාරී මහතා පත්කර ඇත්තේ හදිසි අවශ්‍යතාවය මත, තාවකාලිකව බැවින්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කර නැත.තවද මෙම නිලධාරී මහතාට 2016 වර්ෂයෙන් පසුව එවැනි මාසික දීමනාව ගෙවීම නතර කර ඇත.

3. නීති උපදේශකයෙකු වශයෙන් තෝරාගෙන ඇත්තේ සුදුසුකම්ලත් පල පුරුදු නීතීඥ මහතෙකි.

4. ඔහු පත් කර යුත්තේ කාර්යාලයට අදාළ සියළුම නීති කටයුතු හා නීති උපදෙස් ලබා ගැනීමට බැවින්, ඔහුවෙත නිකුත් කර ඇති පත්වීම් ලිපියේ කලයුතු රාජකාරී වෙන් වෙන් වශයෙන් සටහන් කර නැත.එම කාලයේදී ඔහු කෙටි කාලීන එම රාජකාරී කටයුතු වල නියැලි සිටි බව සඳහන් කරමි.

5. ඔහු වෙත නිකුත් කර ඇති පත්වීම් ලිපියේ සතියකට දෙවතාවක් සේවයට පැමිණිය යුතු බව දන්වා තිබුණද ඊට වඩා වැඩි දින ප්‍රමාණයක් ඔහුගේ සේවය ලබා ගෙන තිබූ බැවින්, සේවය පැමිණීම පිළිබඳ වාර්තාවක් තබා ගැනීමේ අවශ්‍යතාවයක් පැන නොගැනී.

## 5) තිරසාර සංවර්ධනය

### 5.1) තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසාර සංවර්ධන අරමුණු ලෙස ආයතනය විසින් අඳුනාගත් අරමුණු වෙනුවෙන් දායක වීමට කටයුතු කරනු ලබන අතර, එයට අදාල ලඟාකර ගත යුතු ඉලක්ක කරා ලඟා වීමට අවශ්‍ය කටයුතු සිදු කෙරේ.ඒ තුලින් එම ඉලක්ක ලඟා වීමට අදාල ප්‍රගතිය මනින දර්ශක හඳුනාගෙන ඇත.

## 6) ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 6.1) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

(අ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තියට අනුව ගිණුම් වසර අවසාන වී දින 60ක් ඇතුළත ගිණුම් මූල්‍ය ප්‍රකාශන සකස්කර විගණකාධිපති වෙත එවීමට නොහැකි වූයේ පැරණි වර්ෂ වලට අදාළ අවසන් ගිණුම් වාර්තා කිහිපයක් නිම නොවී පැවතීමත් ඒවා ඉක්මනින් අවසන් කිරීමට සිදු වූ බැවිනි. ඉදිරියේ දී ප්‍රමාදයකින් තොරව ගිණුම් වාර්තා විගණකාධිපති වෙත එවීමට කටයුතු යොදා ඇත.

## 7) පද්ධති හා පාලනයන්

(අ) අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශය සඳහා අවශ්‍ය කාර්යය මණ්ඩලය දැන් ලබා දී ඇත.ඒ අනුව එම අංශයේ කටයුතු ස්වාධීනව කරගෙන යෑමට අවශ්‍ය උපකරණ හා පහසුකම් ලබා දීම සිදු කර ඇත.

(ආ) ණයගැති සහ ණයහිමි පාලනය


ඉදිරියේ දී ණයගැතියන්  හා ණයහිමියන් සම්බන්ධයෙන් තොරතුරු වඩා ඉක්මනින් ලබා ගැනීමට සුදුසු නව මෘදුකාංග පද්ධතියක් හඳුන්වා දීමට (Job Manager) කටයුතු කර ඇති අතර, ඒ තුළින් වඩාත් නිවැරදි තොරතුරු ලබා දීමට කටයුතු යොදා ඇත.

(ඇ) අත්තිකාරම් ගෙවීම

අත්තිකාම් ගෙවීමේ දී මුදල්  රෙගුලාසි පිලිපැදීමට කටයුතු කරන අතර, එය ප්‍රමාදයකින් තොරව අදාළ නිලධාරීන් ලබාගත් අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු යොදා ඇත.

(ඈ) වත්කම් පාලනය

ස්ථාවර වත්කම් ලේඛණය, පරිගණක උපාංග ලේඛණය දැනට සකස් කරමින් පවතින අතර, එය ඉක්මනින්ම ඔබ වෙත එවීමට කටයුතු කරනු ලැබේ. ඉන්වෙන්ට්‍රි ලේඛනයක් පාලන අංශය විසින් පවත්වා ගෙන යනු ලබන අතර, භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිසි පරිදි සිදුකර ඔබ වෙත වාර්තා එවීමට කටයුතු කර ඇත.



කේෂාල් ජයසිංහ
සභාපති
සැලසිනෙ රූපවාහිනි ආයතනය

SELACINE TELEVISION INSTITUTE

SELACINE TELEVISION INSTITUTE
No. 224, Bauddhaloka Mawatha, Colombo 7, Sri Lanka
Tel. : 011 432 0777, 011 205 8227 Fax : 011 205 8229
E mail : info@selacine.lk
www.selacine.lk